<u>මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ</u>
<u>දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>

මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කළ දිනයේ සිට මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වේ.

1. සම්බන්ධ වන ආයතන :

1.1. දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව
යොමු අංකය : CPC/RD/1/1/95/II දිනය : 2015.09.22

1.2. අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය
යොමු අංකය : CPC/MI/HRM/05/15/06 දිනය : 2015.09.25

1.3. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
යොමු අංකය : CPC/CS/2/3/SM/I(I) දිනය : 2015.10.14

1.4. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම.
යොමු අංකය : DMS/D/පොදු/11-2 දිනය : 2012.12.19

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NPC/10/71/4/SR දිනය : 2015.12.29

2. උසස් කිරීමේ බලධාරියා :- මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.05.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය :- ආශ්‍රිත නිලධාරි සේවා ගණය

3.2. ශ්‍රේණි :- ග්‍රාම සංවර්ධන නිලධාරි - විශේෂ ශ්‍රේණිය.

3.3. පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය:- මධ්‍යම පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන විධිවිධානවලට අනුකූලව සහ දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් නිකුත් කරන විධිවිධානවලට අනුකූලව ඵලදායි ග්‍රාමීය සංවර්ධනයක් උදෙසා මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ පැවරෙන කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන උපාය මාර්ග හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් මගින් තමා සේවය කරන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ග්‍රාමීය සංවර්ධනය ශක්තිමත් කිරීම තුළින් මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සහ ඒ සම්බන්ධව පළාත් අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම.

4. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය:- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත.

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය :- MN 7 - 2006 A
5.2. වැටුප් පරිමාණය:- රු.20,030 – 11 × 365 - 18× 500 - රු. 33,045/-
5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප (රු) |
|---|---|---|
| විශේෂ | පියවර 05 | 21,490/- |

6. නිලධර ගණයට අයත් තනතුර/තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි | විශේෂ | 03 | අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි රජය සහ මධ්‍යම පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන විධිවිධානවලට අනුකූලව සහ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් නිකුත් කරන විධිවිධාවලට යටත්ව ඵලදායි ග්‍රාමීය සංවර්ධනයක් උදෙසා අවශ්‍ය වන උපාය මාර්ග හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම මගින් ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ කටයුතු සම්බන්ධීකරණය හා ඔවුනට උපදෙස් ලබා දීම හා ඒ හා සම්බන්ධ කටයුතු පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධව පළාත් අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම යන කරුණු සාර්ථකව ඉටු කිරීම තුළින් මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා ඉලක්ක කරා ළඟා කර ගැනීම සහ ඒ සම්බන්ධව පළාත් අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: 03 යි

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.05.03 දින
අනුමත ක
ආණ්ඩු තුමී

7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2. විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3. කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4. සීමිත බඳවා ගැනීම

7.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය.

7.4.2. සුදුසුකම්

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3. පලපුරුද්ද : සේවයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ පූර්වාසන්න වසර පහ (05) තුළ නියමිත දිනට වැටුප් වර්ධක උපයාගෙන තිබීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) අනුව MN 4 2006 - A සහ දැනට MN 5 2006 - A වැටුප් ක්‍රමය යටතේ වැටුප් ලබන ග්‍රාම සංවර්ධන නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ සුදුසුකම් ලබා ඇති ඕනෑම නිලධාරියෙකුට අයදුම් කළ හැකිය.)

7.4.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5. වෙනත් සුදුසුකම්

7.4.2.5.1. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.2.5.2. උසස්වීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.2.5.3. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව සුදුසුකම් ලබන දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

7.4.2.5.4. අදාළ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්ව තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.05.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.4.3. වයස

7.4.3.1. අවම වයස් සීමාව : අදාළ නොවේ.

7.4.3.2. උපරිම වයස් සීමාව: අදාළ නොවේ.

7.4.4. බඳවා ගැනීමේ ක්‍රමය : සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

7.4.4.1. ලිඛිත විභාගය :ඇමුණුම 01

7.4.4.2. විභාගය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 යි | 100 | 40 |
| 02. කළමනාකරණය | පැය 03 යි | 100 | 40 |
| 03. සිද්ධි අධ්‍යයනය | පැය 02 යි | 100 | 40 |

(අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය සහ ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.)

7.4.4.3. පවත්වන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව නියම කරනු ලබන ආයතනයක් විසින්

7.4.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ. තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කර බැලේ.

7.4.4.4.1. පවත්වනු ලබන බලධාරියා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.4.5. අයැදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර නිවේදනයක් මගින්.

8. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

9. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ.

11. තනතුරුවලට පත් කිරීම් : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.05.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

12. අර්ථ නිරූපණ හා නිර්වචන

12.1. "ආණ්ඩුකාරතුමිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමිය/තුමා වේ.

12.2. "බඳවා ගැනීමේ පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය වේ.

12.3. "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

12.4. "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් වරයා වේ.

12.5. "දෙපාර්තමේන්තු ප්‍රධානි/පළාත් අධ්‍යක්ෂ" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

12.6. "සේවය" යනුවෙන් අදහස් කරනුයේ ග්‍රාම සංවර්ධන නිලධාරි සේවය වේ.

12.7. "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වීම මගින්ද, තනතුරේ ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු/ඇය දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

12.8. "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

13. අන්තර්ග්‍රහන විධිවිධාන

දැනටමත් මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන් දරණ තනතුරෙහි වෙනසක් නොමැතිව නව පරිපාටියට අන්තර්ග්‍රහණය කරනු ලබන අතර පෙර පරිපාටිය/ව්‍යවස්ථාව යටතේ තමන්ට හිමිව තිබූ ජ්‍යෙෂ්ඨතාවය නොවෙනස්ව පවතී. කෙසේ වුවද මෙම අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතුය.

I. අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කරනු ලබන්නන් ආයතන ප්‍රධානියා මගින් (ඇමුණුම 02) හි දැක්වෙන ආකෘති පත්‍රයට අනුව අයැදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

II. ආයතන ප්‍රධානියා විසින් තමා වෙත ලැබෙන අයැදුම්පත් මෙම පරිපාටිය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතුය.

III. කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් අවශ්‍ය ලිපි ලේඛන හෝ විස්තර සැපයීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

IV. අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ට විධිමත් පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියක් කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

14. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටළුවකදී මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමිය විමසා ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ...[signature]... |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ...[signature]... |
| 03. ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය | (සාමාජික) | ...[signature]... |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ...[signature]... |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ...[signature]... |

දිනය 2016-01-19

ආණ්ඩුකාර ලේකම්,

2016-01-19 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 16/71 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2016.02.10

.................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව

ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/නොකරමි

අනුමත කරමි / ~~නොකරමි~~

.................................
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2016.03.03

.................................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය

දිනය .............................

ඇමුණුම 01

ග්‍රාම සංවර්ධන නිලධාරී විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය.

01. විභාගය පිළිබඳ විස්තරය

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 යි | 100 | 40 |
| 02. කළමනාකරණය | පැය 03 යි | 100 | 40 |
| 03. සිද්ධි අධ්‍යයනය | පැය 02 යි | 100 | 40 |

02. පවත්වනු ලබන බලධරයා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආයතනයක් මගින්

03. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු ප්‍රමාණය අනුව අවශ්‍ය පරිදි.

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 04. අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යසාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, ආකල්ප, කුසලතා අත්පත් කරගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද යන්න මැන බැලීමට හැකි ආකාරයෙන් සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |
| 05. කළමනාකරණය | කළමනාකරණය හා සංවිධාන ක්‍රම/ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති |
| 06. සිද්ධි අධ්‍යයනය | පළාත් සභා නීති ආශ්‍රයෙන් සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.05.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 02

<u>මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ</u>
<u>දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරට බඳවා ගැනීමේ පරිපාටියට</u>
<u>අනුව අන්තර්ග්‍රහණය කිරීමේ ඉල්ලුම් පත්‍රය</u>

I කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි.

1. සේවා ස්ථානය සහ ලිපිනය : ..........................................................................................................
..........................................................................................................................................

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................................

..........................................................................................................මෙනවිය/මහත්මිය/මහතා

3. (i) උපන්දිනය : .......................... (ii) පරිපාටිය ක්‍රියාත්මක වන දිනට වයස :.....................

4. දැනට දරණ තනතුර : ......................................................................................................

5. පත්වීමේ ස්වභාවය : .........................................................

5.1 තනතුරට අදාළ මුල් පත්වීමේ දිනය හා ලිපියේ අංකය : ..........................................................

5.2 පත්විම ස්ථිර කළ දිනය හා ලිපියේ අංකය : ..........................................................................

5.3 වර්ෂ 1994 සිට පරිපාටිය ක්‍රියාත්මක වන දින දක්වා කාලය තුළ උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ පත්වීම් ලැබුවෙක්ද යන්න සඳහන් කරන්න
:.....................................................................................................................

5.4 ඉහත 5.3 පරිදි හැර වෙනත් ආකාරයකින් පත්වීම් ලැබුවන් නම් එහි ස්වභාවය සඳහන් කරන්න.......................................................................................................................

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 අනුව,

1. වැටුප් පරිමාණය : ..........................................

2. වැටුප් කේත අංකය : ..............................................

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව,

1. වැටුප් පරිමාණය : ................................................

2. වැටුප් කේත අංකය: ..............................................

3. 2011.07.31 වැනි දිනට

(අ) වැටුප් තලය : රු ..........................................

(ආ) වැටුප් පියවර අංකය : ......................................

8. දැනට සිටින තනතුරට බඳවා ගැනීමේ පටිපාටිය අනුව දැනට දරන තනතුරට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් : ...........................................................................................................

9. රාජකාරී විස්තරය (සැකෙවින්) : .................................................................................

.......................................................................................................................... ...

10. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වූ දිනයන් :

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | සමත් වූ දිනය |
|---|---|
| 1. .............................................. | ......................... |
| 2. .............................................. | ......................... |
| 3. .............................................. | ......................... |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.05.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11. කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| සිට | දක්වා | තනතුර | ස්ථානය | කාලය (අවුරුදු) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

12. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : .............................

....................................
අයැදුම්කරුගේ අත්සන

2 කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයි.

13. අයැදුම්කරු විසින් 1 සිට 11 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි අතර (අදාළ වේ නම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් වැටුප සඳහා නිර්දේශ ලබා දුන් ලිපියේ පිටපතක්ද ඉදිරිපත් කරමි) ඔහු/ඇය මෙම සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි./ නොකරමි (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුයි.)

දිනය.................................                                   ....................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා

නිල මුද්‍රාව.

3 කොටස - මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා

14. අයැදුම්කරු / අයැදුම්කාරිය මෙම සේවයට අන්තර්ග්‍රහණය කරමි/ නොකරමි.
15. අන්තර්ග්‍රහණය නොකරනේ නම් ඊට හේතු :..........................................................................
..................................................................................................................................................
....................................................................................................................................

16. අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණිය : ............................................

දිනය.................................                                   ....................................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.05.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

(නිල මුද්‍රාව)